**ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය)- 2017**

---

ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල්-පී 108 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**1.2** <u>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය</u>

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික මාර්ගවල ප්‍රධාන පාලම් ඉදි කිරීම මගින් ජාතික මාර්ග ජාලය වැඩි දියුණු කිරීම හා එමගින් ආර්ථික සංවර්ධනය සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 27,250 කට සමාන ජපන් යෙන් මිලියන 16,132 ක් වන අතර ඉන් රු.මිලියන 20,914 කට සමාන ජපන් යෙන් මිලියන 12,381 ක් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 මාර්තු මාසයේදී ආරම්භ කරන ලද අතර 2019 වන විට අවසන් කිරීමට නියමිතය.

**1.3** <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4** <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයනලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

විගණනයේදී පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

අ) ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුල දී රු.මිලියන 33.5 ක් වටිනා මෝටර් රථ 04 ක් ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් වැඩ හා සම්බන්ධ කොන්ත්‍රාත්කරු මාර්ගයෙන් ලබාගෙන තිබුණ අතර අදාල වත්කම්වල ජීවිත කාලයන්ගේ වෙනස්කම් නොසලකා ඒවා කෙරීගෙන යන වැඩ යටතේ පෙන්නුම් කර තිබුණි.

ආ) 2017 දෙසැම්බර් මාසයේදී ජපන් යෙන් මිලියන 154.5 ක අතුරු ගෙවීම්, අදාල මාසයන්ගේ පවතින සත්‍ය විනිමය අනුපාතයන් වෙනුවට රු.1.0825 සහ රු.1.2714 යන විනිමය අනුපාතයන් භාවිතාකර පරිවර්තනය කර තිබුණි. ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය ප්‍රකාශනවල සිවිල් වැඩ පිරිවැය හා ගෙවියයුතු කොන්ත්‍රාත්කරුවන් රු. මිලියන 43.43 කින් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුල අරමුදල් උපයෝජනය හා 2017 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය කළ අරමුදල් පිළිබඳ වැදගත් සංඛ්‍යානමය දත්ත සමහරක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2017 වර්ෂය තුල | | 2017 දෙසැම්බර් 31 දින දක්වා | |
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |
| ජ ජා ස නි | 12,381 | 20,914 | 2,694 | 1,963.38 | 2,680 | 5,634.87 | 7,169.90 |
| ශ්‍රී ලං ර | 3,751 | 6,336 | 300 | 125.50 | 167 | 297.80 | 396.20 |
| | **16,132** | **27,250** | **2,994** | **2,088.88** | **2,847** | **5,932.67** | **7,566.10** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ) ව්‍යාපෘතිය සවිස්තරාත්මක සැලැස්මක් සහ ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර ප්‍රතිඵලයක් වශයෙන්, සමස්ථයක් ලෙස ව්‍යාපෘතියේ ප්‍රගතිය අධීක්ෂණය සහ අගය කිරීම කරමින් ඒ අනුව කාලෝචිතව නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට සහ ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි.

ආ) ව්‍යාපෘතිය යෙන් මිලියන 12,381 කට සමාන රු.මිලියන 20,914 ක මුළු ණය මුදලින් සියයට 46 ක් නියෝජනය කරමින් ලබාගත් ජපන් යෙන් මිලියන 5,635 කට සමාන රු.මිලියන 7,170 ක ණය මුදලක් 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. එබැවින්, ජපන් යෙන් මිලියන 6,746 ක ඉතිරි මුදල ව්‍යාපෘතියේ ඉතිරි කාලය තුලදී භාවිතා කිරීමට හැකිද යන්න සැක සහිතය.

ඇ) ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වැඩ සටහන් මත පදනම්ව සවිස්තරාත්මක අයවැයක් සකස් කර නොතිබුණි. එබැවින්, රේඛීය අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව තුල වෙන් කරන ලද රු.මිලියන 300 න් රු.මිලියන 126 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

ණය ගිවිසුමට අනුව, පැකේජ් 05 ක් යටතේ ජාතික මාර්ග 19 ක නව ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමට අපේක්ෂා කරන ලද අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී නිම කිරීමට නියමිතව තිබුණි. පැකේජ් 01 යටතේ රු.මිලියන 7,098 ක පිරිවැයකට ඉදිකිරීමට නියමිතව තිබූ ප්‍රධාන පාලම් 10 න් ප්‍රධාන පාලම් 09 ක ඉදිකිරීම් වැඩ 2017 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණි. කෙසේ වෙතත්, පැකේජ් 01 යටතේ, කොළඹ - ගාල්ල - හම්බන්තොට - වැල්ලවාය මාර්ගයේ පිහිටි පොල්වතුමෝදර හා ගොවියාපාන යන පාලම් 02 හි ඉදිකිරීම් වැඩ දින 150 ක ප්‍රමාදයකින් නිම කර තිබුණි. රු. මිලියන 3,786 ක ඇස්තමේන්තුගත පිරිවැයකට පැකේජ් 02 යටතේ ඉදිකරන ප්‍රධාන පාලම් 08 හි භෞතික ප්‍රගතිය 2017 දෙසැම්බර් 31 දිනට සියයට 34 සිට සියයට 57 දක්වා පරාසයක පැවතුණි. තවද, අනෙක් ප්‍රධාන පාලම් 19 හි වැඩ වෙනත් පැකේජ් 03 ක් යටතේ සැලසුම් කිරීමේ හා සමාලෝචනය කිරීමේ අදියරයන්හි පැවතුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ) ව්‍යාපෘතිය විසින් පැකේජ් 01 යටතේ ඉදිකිරීමට නියමිත වූ ප්‍රධාන පාලම්වල ප්‍රමාණපත් විධිමත් විස්තරාත්මක ඉංජිනේරු අධ්‍යයනයකින් තොරව සකස්කර තිබුණු බව නිරීක්ෂණය විය. 2017 දෙසැම්බර් 31 දිනට අදාල පාලම්වල ඉදිකිරීම් වැඩ අවසන් වුවත් ප්‍රමාණපත්හි අන්තර්ගත අයිතම 660 ක් යටතේ වූ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 374.39 ක වැඩ සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. තවද, විෂය පථයේ වූ අනෙකුත් අයිතම 244 ක වැඩ වැඩිවී තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 272.48 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි.

ආ) ණය ගිවිසුමේ 2(4) ඡේදයේ 04 වන උපලේඛනය අනුව, ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් වැඩවල මුළු පිරිවැයෙන් සියයට 30 ක් නියෝජනය වන පරිදි පාලම් ඉදිකිරීමේ කටයුතු සඳහා ජපන් නිෂ්පාදන හා සේවාවන් යොදාගත යුතුය. කෙසේවෙතත්, ඒ සඳහා භාවිත කිරීමට අවශ්‍ය ජපන් නිෂ්පාදන හා සේවාවන් හඳුනා ගැනීමට ව්‍යාපෘතිය විසින් නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. ඉහත සඳහන්කළ ණය ගිවිසුමේ සඳහන් අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට හක්මන - මීල්ල - තලහගන්වඩුව මාර්ගයේ දෙනගම පිහිටි මීටර් 30.49 ක දිගකින් හා මීටර් 3.65 ක පළලකින් යුත් වූ පැරණි පාලම වෙනුවට, ව්‍යාපෘතිය රු.මිලියන 485 ක පිරිවැයකට මීටර් 90 ක දිගකින් හා මීටර් 10.40 ක පළලකින් යුත් යකඩ පාලමක් මිලදී ගෙන ඉදිකර තිබුණු බව නිරීක්ෂණය විය.

ඇ) 2018 ජූලි මසදී පැකේජ් 01 යටතේ දකුණු පළාතේ ඉදිකිරීම් වැඩ අවසන් ප්‍රධාන පාලම් 09 ක සිදු කරන ලද වැඩබිම් පරීක්ෂාවේදී සියලුම පාලම්වල ප්‍රසාරණ පැස්සුම නිසිලෙස සවිකර නොතිබූ අතර මාර්ගයන්හි රිය මඟවලට, පා පුවරුවට ආසන්න කොන්ක්‍රීට් දාරවලට සහ අත්වැට වලට හානි සිදුවී තිබුණු බව අනාවරණය විය.

### 3.4 මතභේදයට තුඩුදෙන කරුණු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

අ) ණය ගිවිසුමේ 2(1) ඡේදයේ 04 වන උපලේඛනය යටතේවූ වගන්තියට අනුව, ජපන් කොන්ත්‍රාත්කරුවන් හෝ ජපන් කොන්ත්‍රාත්කරුවන් සමඟ සහයෝගීව ඇති කර ගත් බද්ධ ව්‍යාපාර පමණක් ව්‍යාපෘතිය යටතේ වූ සිවිල් ඉදිකිරීම් වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලැබුවන් ලෙස සඳහන් කර තිබුණි. ප්‍රතිඵලයක් ලෙස, පැකේජ් 01 යටතේ ඉදිකිරීම් වැඩ සඳහා ලංසුකරුවන් 03 දෙනෙක් පමණක් ප්‍රතිචාර දක්වා තිබුණු අතර පැකේජ් 02 යටතේ ඉදිකිරීම් වැඩ සඳහා එක් ලංසුකරුවකු පමණක් ප්‍රතිචාර දක්වා තිබුණි. මේ අනුව, ඉහත සඳහන් කල ණය ගිවිසුමේ වගන්තිය මගින් ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම්

වැඩ සඳහා ලංසු ඉදිරිපත් කිරීම මත සාධාරණ තරඟයක් සඳහා තිබූ අවස්ථාවන් සීමා කර තිබුණු බවට සාක්ෂි විය.

ආ) ව්‍යාපෘතිය කොන්ත්‍රාත් පැකේජ් 01 යටතේ 2015 ජූනි මස සිට මෝටර් රථ 15 ක් කුලියට ගෙන තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින තෙක් කුලී ගාස්තු ලෙස රු.මිලියන 218 ක් වැය කර තිබුණි. ලැබී ඇති තොරතුරු අනුව, එවැනිම වර්ගයේ මෝටර් රථයක් දැනට පවත්නා වෙළෙඳපල මිල ගණන් යටතේ රු.මිලියන 121.90 කට සම්පූර්ණයෙන්ම අත්පත්කර ගැනීමට හැකියාව තිබේ.

### 3.5 නිෂ්ඵල වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ) ව්‍යාපෘතිය ඉදිකිරීම් වැඩ සඳහා විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් පවත්වාගෙන නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස, කෑගල්ල, රත්නපුර හා කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි නැවත ඉදිකිරීම සඳහා මුලින් හඳුනාගෙන තිබූ ප්‍රධාන පාලම් 09 ක් පසුව අවලංගු කර තිබුණි. එබැවින්, ඉහත සඳහන් පාලම්හි නිර්මාණ සැලසුම් සඳහා ව්‍යාපෘතිය විසින් 2016 වර්ෂයේදී වැය කළ රු.මිලියන 1.27 නාස්තිකාර වියදමක් බවට පත්ව තිබුණි.

ආ) රු. මිලියන 80.71 ක ඇස්තමේන්තුගත පිරිවැයකට 2015 මාර්තු 20 දින ආරම්භ කළ කොළඹ - ගාල්ල - හම්බන්තොට - වැල්ලවාය මාර්ගයේ පොල්වතුමෝදර පිහිටි අනෙක් පාලමෙහි ඉදිකිරීම් වැඩ තෝරාගත් ස්ථානයේ දුර්වල බිම් තත්ත්වය හේතුවෙන් පසුව අතහැර තිබුණි. එමනිසා, 2016 වර්ෂය තෙක් ඒ සඳහා වැය කර තිබූ රු.මිලියන 17.99 ක මුදල නාස්තිකාර වියදමක් බවට පත්ව තිබුණි.

ඇ) වියපැහැදම් නොකළ ණය ප්‍රමාණය මත පිළිවෙළින් සමාලෝචිත වර්ෂයේදී සහ පෙර වර්ෂයේදී එකතුව රු.මිලියන 25.26 ක බැඳීම් ගාස්තු ණය ලබා දෙන ආයතනය විසින් අය කර ගෙන තිබුණි.

### 3.6 ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කටයුතු

ලැබී ඇති තොරතුරු අනුව, ව්‍යාපෘතිය පැකේජ් 03 ක් යටතේ ප්‍රධාන පාලම් 13 ක් ඉදිකිරීම සඳහා රජයේ ඉඩම් 178 ක් ඇතුලත්ව ඉඩම් කැබලි 390 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබූ අතර ඉඩම් කැබලි 69 ක් සඳහා වන්දි රු.මිලියන 186.04 ක් 2017 දෙසැම්බර් 31තෙක් ගෙවා තිබුණි. මීට අමතරව සමාලෝචිත වර්ෂය අවසාන වන විට වන්දි ගෙවීම් නිරවුල් කිරීමේ ප්‍රමාදය මත පොළී ලෙස රු.මිලියන 9.38 ක් ගෙවා තිබුණි.

### 3.7 මානව සම්පත් කළමනාකරණය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සේවා තනතුරු 61 ක් අනුමත කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ කාර්ය මණ්ඩලය සාමාජිකයින් 36 දෙනෙකුගෙන් සමන්විත විය. ඉංජිනේරු තනතුරක් හා තාක්ෂණික නිලධාරී තනතුරු 09 ක් ඇතුලුව තනතුරු 25 ක් පිරවීමෙන් තොරව වසර 03 කට අධික කාලයක් මුලුල්ලේ පැවතුන බව සමාලෝචිත වර්ෂයේ අවසානයට නිරීක්ෂණය විය.